## 1.18 ගර්භණීභාවය හා බැඳුණු සිංහල සමාජ ආකල්ප පද්ධතිය පිළිබඳ විමර්ශනයක්

ඒ.එල්.එන්. පුෂ්පමාලි පෙරේරා
සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.

---

### ABSTRACT

කිසියම් ජීව අජීව වස්තුවක් හෝ සංසිද්ධියක් හෝ දීර්ඝ කාලයක් තිස්සේ යම්කිසි ජන සමූහයක් ඇසුරේ පැවතීම නිසා එම වස්තුව හෝ සංසිද්ධිය පදනම් කරගෙන ඒ වටා බැඳෙන අදහස් උදහස් ඇදහිලි විශ්වාස පද්ධතිය එම සමාජයට අයත් ''සමාජ ආකල්ප'' ලෙස හැඳින්විය හැකි ය. විවිධ ජන සමාජයන්හි සමාජ ආකල්ප ගොඩ නැගීමෙහි ලා මිනිස් හැසිරීම් මගින් සෘජු බලපෑමක් ඇති කෙරේ.

කෘෂි අර්ථ ක්‍රමය මත ගොඩනැගුණු ලාංකේය සමාජයේ ද ශ්‍රම මූලික දායකත්වය අවශ්‍යය ම කාරණයක් වූයෙන් 'දරුවන් උත්පාදනය' අතීත සමාජයේ විවාහයේ මූලික අභිප්‍රාය විය. එමෙන් ම ලාංකේය සමාජයේ ජාතකර්මයේ සිට මරණය තෙක් පවත්නා ජීවිත ප්‍රතිසංස්කරණ උත්සව අතර විවාහය අත්‍යවශ්‍ය ම සාමාජීය කාර්යභාරයකි. එය වූකලි පුද්ගලයකුගේ සමාජ ජීවිතයේ අවතරණ අවස්ථාවකි. 'ස්ත්‍රියක් හා පුරුෂයෙක් ආචාරශීලි හවුල් ජීවිතයක් ගතකිරීම' සරල ව විවාහය යන්නෙන් අර්ථවත් වේ. විවාහයට පූර්ව ලිංගික සබඳතා සමාජ සම්මතයට පටහැනි වූවකි. විවාහය මගින් පුද්ගලයෙකුට කායික හා මානසික ලිංගික අවශ්‍යතා සන්තෘප්ත කර ගැනීම සඳහා වූ සමාජ අවසරය පිළිගන්වනු ලැබේ. විවාහය වූකලී 'ලිංගික බලපත්‍රයක්' ලෙස හඳුන්වනු ලබන්නේ මෙම පදනම මත ය. ඒ අනුව විවාහය මගින් එක් අංශයකින් කෙරෙනුයේ සමාජ සම්මතයන් තවදුරටත් තහවුරු කිරීමකි.

පුද්ගල රාශීවීම මත නිර්මිත සමාජයේ අඛණ්ඩ පැවත්ම සඳහා නව සාමාජිකයන් දායක කිරීමේ වගකීම විවාහය තුළින් යුවතිපතීන් හට පැවරීමක් සිදුවේ. සමාජයේ අඛණ්ඩ පැවත්ම උදෙසා නව සාමාජිකයින් දායක කරණු ලබන විධිමත් ආයතනය පවුල වූයෙන් මෙම වගකීමෙන් පෞද්ගලික ව නිදහස් වීමට අයිතියක් නැත. තව ද විවාපත් යුවලගේ උත්තරීතර ප්‍රාර්ථනය ද සිහිනය ද කැදැල්ලට නව සාමාජිකයකු කැඳවා ගැනීම ය. මේ සියල්ලෙහි ඒක මිතියෙන් ලාංකේය සමාජයේ කාන්තාව දරුවන් ලැබීම අවශ්‍යයම සංසිද්ධියක් බවට පත්වීමෙහි ප්‍රතිඵලය වූයේ ගර්භණීභාවය විෂයෙහි විවිධ සමාජ ආකල්ප පද්ධතියක් නිර්මාණය වීම ය. එකී සමාජ ආකල්ප පද්ධතිය පිළිබඳ විමර්ශනය කිරීම මෙමගින් අපේක්ෂිත ය.